**සමුපකාර අතිරික්ත අරමුදල - 2023**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 වියාචනය කළ මතය**

සමුපකාර අතිරික්ත අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 වියාචනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වියාචනය කළ මතයක් පළ කරනු ලැබේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ මතය වියාවනය සඳහා පදනම ,කෙසේ වුවද . කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| අරමුදල ආරම්භයේ සිටම ආදායම් බදු ගෙවා නොතිබූ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් බද්දට යටත් නොවන ආයතනයක් බව තහවුරු කර ගැනීමෙන් තොරව ස්ථාවර තැන්පත් සඳහා ලද පොලිය මත රඳවාගැනීමේ බදු 2017 වර්ෂයේ සිට රු. 396,847 ක් හා 2023 වර්ෂය සඳහා රු.9,909,040 ක් ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි. | ගැටලු නිරාකරණය කිරීම සම්බන්ධව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමුකර ඇති බව. | බද්දට යටත් නොවන බව තහවුරු කරගෙන ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

**1.5.2 අවිනිශ්චිත ගිණුම්**

| විෂය | මුදල රු. | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| අවිනිශ්චිත ගිණුම | 9,475,735 | අවුරුදු 11 කට අධික | තොරතුරු සොයා ගැනීමේ අපහසුව මත නිරවුල් කිරීම ප්‍රමාද වී ඇති බව. | ශේෂය හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|---|
| (අ) | ලැබිය යුතු සමූපකාර සමිති ණය | 552,703,857 | ශේෂ සනාථන | 2023 දෙසැම්බර් 31දිනට ශේෂය තහවුරු කර ලබා දෙන ලෙස අදාල සමිති වෙත දැනුම්දී ඇති බව | ශේෂ සනාථන ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | සමූපකාර අරමුදලින් ලැබිය යුතු මුදල | 5,029,486 | ශේෂ සනාථන | තහවුරු කිරීම් ලබා ගැනීමට කටයුතු කරමින් සිටින බව | -එම- |
| (ඇ) | ලැබිය යුතු භාණ්ඩාගාර නියෝජ්‍ය ණය | 81,871,370 | ශේෂ සනාථන | තහවුරු කිරීම් ලබා ගැනීමට කටයුතු කරමින් සිටින බව | ශේෂ සනාථන ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | ගෙවිය යුතු භාණ්ඩාගාර අරමුදල | 150,000 | විස්තරාත්මක උපලේඛන | දීර්ඝ කාලයක සිට පැවත එන ශේෂ ගිණුම් වලින් ඉවත් කිරීම සඳහා අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇති බව | විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | ගෙවිය යුතු ජාතික භාරකාර අරමුදල | 3,871,256 | විස්තරාත්මක උපලේඛන | -එම- | -එම- |
| (ඊ) | පොදු තැන්පත් ගිණුම | 8,439,190 | විස්තරාත්මක උපලේඛන | තහවුරු කිරීම් ලබා ගැනීමට කටයුතු කරමින් සිටින බව | -එම- |
| (උ) | ස්ථාවර තැන්පත් ඇප ණයගිම්යෝ | 58,918,112 | ණය ලිපිගොනු සහ ශේෂ සනාථන | සොයා ගැනීමේ අපහසුතාවය මත නිරවුල් කිරීමේ ගැටළු පවතින බව | ශේෂ සනාථ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | ඇවර ගිණුම් (හර ශේෂය) | 2,620,473 | පිළියෙල කරන ලද ඇවර ගිණුමේ පිටපත් | -එම- | -එම- |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (අ) | අක්‍රිය ණය උපලේඛණය අනුව 1989 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලය තුල අරමුදලින් සමූපකාර සමිති 69 කට ලබා දී තිබුණු රු.125,231,173 ක ණය මුදලින් 2023 ජනවාරි 01 දිනට රු.87,986,525 ක ශේෂයක් අයවීමට පැවති අතර සමාලෝචිත වර්ෂයේ ණය වාරික ලෙස රු.1,024,971 ක් පමණක් ලැබී තිබුණි. 2023 ජනවාරි 01 දිනට ලැබිය යුතු රු. 102,215,361 ක ණය පොලියෙන් රු.497,630 ක මුදලක් පමණක් ලැබී තිබුණි. | ණය වර්ග 06 ක් ප්‍රතිලේඛනගත කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් පවතින බව | ණය වාරික හා පොළී අයකර කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විවිධ වත්කම් යටතේ දක්වා තිබුණු 1999 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.1,721,566 ක් වූ අහරු චෙක්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ නිරවුල් කිරීම සම්බන්ධව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත විමසීම් කර ලිපි යොමු කර ඇති බව. | අහරු චෙක්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු රු.221,235,967 ක ණය පොලියෙන් වර්ෂය තුල ලැබ් තිබුණේ රු.11,184,856 ක් පමණි. | 2018 වර්ෂයට පෙර ලබා දුන් ණය වන අතර 2023 ජනවාරි 01 දිනට රු.513,936,249 ක මුදල තුල ඉදිරි වර්ෂය වලදී අයකරගත යුතු ණය වාරිකයන්ද පවතින බව | ණය පොලී අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීමට ප්‍රමුඛතාවය දෙමින් කිරි සුපිරි අලෙවිසැලක් සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට හා අලෙවිසැලක් ආරම්භ කිරීම සඳහා 2007 වර්ෂයේදී රු.15,587,000 ක පොලී රහිත ණය මුදලක් වසර 20 ක් තුල ගෙවා නිම කිරීමට ලබා දී තිබුණි. ණය මුදල ලබා දී වසර 16 ක් ගත වී තිබුණද, අයකර ගෙන තිබුණු මුදල රු. 737,250 ක් වූ අතර, 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයවිය යුතු ශේෂය රු.14,849,750 ක් වී තිබුණි. | මෙම සංගමය ඇවර කරණය සඳහා මුලික අදියරයන් සිදුකරමින් පවතින අතර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරන බව | ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවට 2013 වර්ෂයේදී ලබා දී තිබූ රු.75,000,000 ක ණය මුදලින් 2023 දෙසැම්බර් 31 දින වන විට රු.62,091,372 ක් මුදලක් අයවීමට පැවති අතර ඒ සඳහා අයවිය යුතු පොලිය රු.85,435,460 ක් විය. 2023 දෙසැම්බර් 31 දින වන විට ණය මුදල ලබා දී වර්ෂ 11ක් ගත වී ඇතත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, හිඟ ණය මුදල හා පොළී මුදල අය කර ගැනීම අමාත්‍යාංශ මට්ටමින් සිදු කළ නොහැකි නම් අමාත්‍ය මණ්ඩලයට යොමු කරන ලෙස 2021 අගෝස්තු 05 දින පවත්වන ලද රාජ්‍ය ගිණුම්කාරක සභාවේදී නියෝග කර තිබූ අතර වර්ෂ 2 ½ ක් ගත වී ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ණය අයකර ගැනීමට අඛණ්ඩව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය සහ සී.ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව දැනුවත් කරන ලද බව | ණය මුදල් අයකර ගැනීමට සහ ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ විවිධ වගකීම් යටතේ දක්වා තිබූ අතිරික්ත අරමුදලට ගෙවිය යුතු රු.6,017,551 ක් වූ ශේෂය 1987 වර්ෂයේ සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ නිරවුල් කිරීම සම්බන්ධව අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇති බව | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | ගෙවිය යුතු වගකීම් යටතේ 2009 වර්ෂයේ සිට පැවත එන වැඩිපුර අයවීම් රු.196,201 ක් සහ 2018 වර්ෂයේ සිට පැවත එන ගිණුම් මාරු රු.100,000 ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර අයවීම් රු.196,201 තහවුරු කිරීම සඳහා අදාල සමිතිය වෙත ලිපියක් යොමු කර ඇති නමුත් ප්‍රතිචාර ලැබී නොමැති අතර ගිණුම් මාරු රු.100,000 ක මුදල සම්බන්ධව විස්තර සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |

### 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ජූනි සිට දෙසැම්බර් දක්වා රු.මිලියන 6 සිට රු.මිලියන 5 දක්වා පරාසයක අත ඉතිරිය මුදල් රඳවා ගෙන තිබූ අතර එම මුදල් ඵලදායක ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි. | මාසය අවසානයේ අතැති මුදල් ශේෂය සලකා බලා ආයෝජනය කිරීම් පසු මාසයේදීම සිදු කර ඇත .ආයෝජනය කිරීම් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව | මුදල් ඵලදායි ලෙස ආයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.441,430,472ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.230,070,179 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.211,360,293 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පොළී ආදායම රු.146,320,337 කින් වැඩිවීම සහ වෙනත් වියදම් රු.63,853,913 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමූපකාර සමිතිවලට පමණක් ණය දියහැකි බවට පනතේ ප්‍රතිපාදන තිබුණද, ඊට පටහැනිව සමූපකාර තොග වෙළඳ සංස්ථාවට 2012 වර්ෂයේදී රු.13,969,497 ක පොලී රහිත ණය මුදලක් ලබා දී තිබුණි. | ණය අයකර ගැනීමට 2023 ඔක්තෝබර් 19 දිනැති ලිපිය මඟින් එම ආයතනය දැනුවත් කර ඇති බව. | පනතේ ප්‍රතිපාදන අනුව ණය ලබා දීමට ක්‍රියා කළ යුතුය. |